# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## අංගම්පොර සහතිකපත්‍ර පාඨමාලාව (Certificate in Angampora) 2022

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි මානව විද්‍යා අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන අංගම්පොර සහතිකපත්‍ර පාඨමාලාව 2022 වර්ෂයට පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයගෙන් 2022 නොවැම්බර් 30 දිනට පෙර අයදුම්පත් කැඳවනු ලැබේ.

### අංගම්පොර සහතිකපත්‍ර පාඨමාලාව

1. **සුදුසුකම්**

    - අ.පො.ස සා/පෙළ විභාගය සිංහල හා බුද්ධ ධර්මය ඇතුළු විෂයයන් හයකින් සමත්වීම

      හෝ

    - ආරක්ෂක සේවාවන්හි නියැලි පුද්ගලයෙකු නම් (පොලිසිය, ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක සේවය) අවම වශයෙන් වසර පහක සේවා කාලයක් සපුරා පැවතීම.

    **වයස් සීමාව**

    - වයස අවුරුදු 16 - 45 ත් අතර පසුවන කායික මානසික නිරෝගී භාවයෙන් යුක්ත පුද්ගලයකු විය යුතුය.

2. **අයකිරීම - රු.45,000/=**

    කාලය - මාස හයයි.
    දේශන - සෙනසුරාදා දිනයන්හි පෙ.ව 8.00 සිට ප.ව 5.00 දක්වා
    මාධ්‍යය - සිංහල

3. මෙම පාඨමාලාව සමත්වීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත අංගම්පොර ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

4. අයැදුම්පත සහ පාඨමාලාව පිළිබඳ විස්තර www.sjp.ac.lk හෝ www.fhss.sjp.ac.lk වෙබ් අඩවියෙන් සහ මානව විද්‍යා අධ්‍යයනාංශයට පැමිණ ලබාගත හැකිය. අදාළ අයැදුම්පත සමඟ ගංගොඩවිල මහජන බැංකු ශාඛාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ගිණුම් අංක 013010001488 යට බැරවන පරිදි රුපියල් 1000/= මුදලක් ගෙවා ලබාගත් රිසිට්පත පාඨමාලා සමායෝජක, අංගම්පොර සහතිකපත්‍ර පාඨමාලාව, මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට එවන්න.

5. පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී මුළු පාඨමාලා ගාස්තුවෙන් පළමු වාරිකය (රුපියල් 25000/= ක මුදලක්) පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතු අතර ඉතිරි මුදල පාඨමාලාව ආරම්භ වී මාස දෙකක් ඇතුළත ගෙවිය යුතු ය.

විමසීම් :-
මහාචාර්ය චාමලී නහල්ලගේ
අධ්‍යයනාංශ ප්‍රධාන
මානව විද්‍යා අධ්‍යයනාංශය
දු.ක. :- 011 - 2801187
විද්‍යුත් තැපැල:- anthropology@sjp.ac.lk

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ